# CII 07 ශ්‍රී ලංකාවේ මෑත කාලීන උද්ධමනයට බලපාන හේතු 2002 2011 දත්ත දත්ත ඇසුරින් අධ්‍යයනය

චම්පිකා ඩී. කේ.

ආර්ථික විද්‍යා අධ්‍යනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය

පසුගිය දශකය තුළ සෙසු දියුණු වෙමින් පවතින රටවල උද්ධමනයට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ උද්ධමන අනුපාතය සාමාන්‍යයෙන් ඉහළ මට්ටමක පැවතිණ. ශ්‍රී ලංකාවේ උද්ධමනයට එම සාධකවල බලපෑම සහ එම බලපෑම දිගුකාලීනව පවතී ද යන්න විස්තර කිරීම පර්යේෂණයේ අරමුණ විය. එහිදී ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි ද්විතීය.ක තොරතුරු හා දත්ත අනුව ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා, ආර්ථික විමසුම සඟරාව හා අන්තර්ජාල මූලාශ්‍ර පදනම් කරගෙන ප්‍රමාණාත්මක විශ්ලේෂණය යටතේ ස්වායත්ත විචල්‍යය ලෙස නව කොළඹ පාරිභෝගික මිල දර්ශකය(NEWCCPI) හා ශ්‍රී ලංකා පාරිභෝගික මිල දර්ශකය(SLCPI) භාවිත කරමින් අවස්ථා ද්විත්වයක් යටතේ පුළුල් මුදල් සැපයුම සහ ආනයන ඒකක මිල යන පරායත්ත විචල්‍යයෙන්, ස්වායත්ත විචල්‍යයට වන බලපෑම 2002-2011 මාසික දත්ත පදනම් කරගෙන, බහුවිධ ප්‍රතිපායන විශ්ලේෂණය මගින් අධ්‍යයනය කරන ලදි. ප්‍රමාණාත්මක විශ්ලේෂණය යටතේ නව කොළඹ පාරිභෝගික මිල දර්ශකය සඳහා ආකෘතිගත සමීකරණයට ලද ප්‍රතිඵල අනුව සළකා බලන මාසයට, මාසයකට පෙර පුළුල් මුදල් සැපයුම වර්ධන ප්‍රතිශත වෙනස සහ සළකා බලන මාසයට, මාස එකකට හා දෙකකට පෙර මාසවල ආනයන ඒකක මිල වර්ධන ප්‍රතිශත වෙනස මගින් වෙසෙසි බලපෑමක් සිදුවන බව නිගමනය විය. මෙහිදී ගලපන ලද නිර්ණන සංගුණකයට අනුව ස්වායත්ත විචල්‍ය මඟින් පරායත්ත විචල්‍යයේ විචලනය 38%ක් ආවරණය කර ඇත. එමෙන්ම නිමානකයේ වටිනාකම දෙකෙන් බෙදීමෙන් ලැබෙන අගයට වඩා නිමානකයේ සම්මත දෝෂය කුඩා වීමෙන් නිමානකය සංඛ්‍යානමය වශයෙන් වෙසෙසි විය. එමෙන්ම F අගයට අදාළP අගය 0.007 වීම මත සමස්ත ආකෘතිය වෙසෙසි ආකෘතියක් වන බව නිගමනය කළ හැකිය. එම ආකෘතියට අනුව කොළඹ පාරිභෝගික මිල දර්ශකය සළකා බලන මාසයට මාස එකකට පෙර පුළුල් මුදල් සැපයුම 1% වැඩි වන විට එහි බලපෑමෙන් සළකා බලන මාසයේ මිල දර්ශකය 17% ඉහළ යන බවත් සළකා බලන මාසයට මාස එකකට හා දෙකකට පෙර ආනයන ඒකක මිල 1% වැඩිවන විට පිළිවෙළින් සළකා බලන මාසයේ මිල දර්ශකය එහි බලපෑමෙන් 4% හා 3%කින් ඉහළ යන බව නිගමනය වූ අතර ශ්‍රී ලංකා පාරිභෝගික මිල දර්ශකය යටතේ ද මීට සමාන ප්‍රථිපල ලැබිණ. මේ අනුව මුදල් සැපයුමේ වර්ධනය පාලනය කිරීම, අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය අවමකිරීම, ආදේශක දේශිය නිෂ්පාදන දිරිගැන්වීම යනාදී ක්‍රියාමාර්ග මත උද්ධමනය සැළකියයුතු මට්ටමකට අඩුකර ගැනීමේ හැකියාව ලැබේ.

**ප්‍රමුඛ පද:** ශ්‍රී ලංකාව, උද්ධමන අනුපාතය, පුළුල් මුදල්සැපයුම, ආනයන ඒකක මිල